# ජනසන්නිවේදන ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය 2008

ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

2008 අගෝස්තු 10

## *අතීතය, සන්නිවේදනය සහ භාෂාව*

මහාචාර්ය අනුර මනතුංග
පුරාවිද්‍යා අංශය/ ආසියානු අධ්‍යයන මධ්‍යස්ථානය

අතීත සංකල්ප භාෂාව තුළින් වර්තමාන සමාජයට සන්නිවේදනය වී ඇති ආකාරය පිළිබඳව මෙරට අතීතයත්, සිංහල භාෂාවත් ඇසුරින් අදහස් කීපයක් ඉදිරිපත් කිරීම මෙම දේශනයේ මුඛ්‍ය අරමුණ වේ . අතීතය හෙවත් යටගියාව , විද්‍යාමාන වර්තමානය දක්වා සන්නිවේදනය වීමේ ප්‍රධාන වාහකයක් ලෙස භාෂාව හඳුන්වා දිය හැකිය. එහෙත් භාෂාව සාපේක්ෂ ගතික ස්වභාවයෙන් යුතු මාධ්‍යයක් බැවින් අතීත සමාජයේදී ඉන් ධ්වනිත වූ අර්ථය වත්මන් සමාජය තුළට සන්නිවේදනය වීමේදී සිදු වී ඇති වෙනස්කම් කෙරේ මෙහිදී මා විශේෂ අවධානයක් යොමු කරනු ලැබ ඇත.

භාෂාව , වත්මන් සමාජයට දායාද වූයේ අතීත සමාජයෙනි. එහෙයින් ඉන් අතීත සමාජයේ බොහෝ ලක්ෂණ පිළිබිඹු වීම නොවැලැක්විය හැකිය. ඇතැම් විට භාෂාව තුළින් පහසුවෙන්ම අපට අතීත සමාජයේ